**ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 අප්‍රේල් 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 අප්‍රේල් 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 දෙසැම්බර් 21 දිනැති අංක 07/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව පරිහරණය කරනු ලබන වාහනවල ලියාපදිංචි අයිතිය නිරවුල් කර ගත යුතු වුවත් රාජ්‍ය ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් 2019 ජනවාරි 22 දින දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ අංක KF 9142 දරන වාහනයේ අයිතිය නිරවුල් කර වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් මඟින් හෙළිදරව් කිරීමට මෙම වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අදාල වාහනය දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර තිබේ. | චක්‍රලේඛය ප්‍රකාරව පරිහරණය කරනු ලබන වාහනවල ලියාපදිංචි අයිතිය නිරවුල් කර ගිණුම් මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු වීම. |

#### (ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා / විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i) ස්ථාවර වත්කම් ලේඛනය**<br>2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සීගැස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් වත්කම් ලේඛන පිලියෙල කර යාවත්කාලින කර නොතිබුණි. | ලේඛන පවත්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | සිගැස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |

(ii) **ඇප ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ලේඛන පවත්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනුලැබේ | ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| <u>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|---|
| (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 (2) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය, කෙලින්ම ගබඩා භාරව සිටින නිලධාරියා හෝ නිලධාරින්ද ඔහුට හෝ ඔවුන්ට ආසන්නතම යටත් නිලධාරින්ද හැර වෙනත් වගකිව යුතු නිලධාරින් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර එබඳු නිලධාරින් දෙපාර්තමේන්තුවේ නොමැති නම් වෙනත් රජයේ දෙපාර්තමේන්තුවලින් නිලධාරින් පත් කර ගත හැකිවේ. එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් ආයතනයේ ගණකාධිකාරි, සංවර්ධන නිලධාරි හා කළමණාකාර සේවා නිලධාරි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා පත් කර සභාපති ලෙස ගණකාධිකාරිවරිය පත් කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගබඩා කළමනාකරණයට වග කිව යුතු නොවන නිලධාරීන් සමීක්ෂණ කටයුතු සඳහා පත් කිරීමට 2023 වර්ෂයේ සිට පියවර ගනු ලැබේ. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිලධාරීන් පත් කිරීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන සම්බන්ධ මාසික ප්‍රවාහන සේවා සටහන, 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි | වාහනවලට අදාල මාසික කාර්යසාධන සාරාංශය හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු විම. |
| (iii) 2015 ජූලි 14 දිනැති අංක04/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2017 පෙබරවාරි 15 දිනැති අංක PFD/INFR/TRPT/CC/02 දරන රාජ්‍ය මුදල් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | රාජ්‍ය ආයතන තම ආයතනික අවශ්‍යතාව අනුව රක්ෂණ ආවරණයන් සලසා ගැනීමේදී ගනුදෙනුවල විනිවිදභාවය, අවදානම් කළමනාකරණය මෙන්ම පිරිවැය කාර්යක්ෂමතාව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වෙළඳපල තුළ ක්‍රියාත්මක රක්ෂණ සේවාවන් සපයන රක්ෂණ සංස්ථාව, ජාතික රක්ෂණභාර අරමුදල සහ පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් යන ආයතන වෙතින් මිල ගණන් කැඳවීම තුලින් තරඟකාරී ලෙස සිදු කර ගත යුතු වුවත් මිල කැඳවීමෙන් තොරව වාහන රක්ෂණ කටයුතු ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් සිදු කරවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ සිට මිල කැඳවීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කෙරේ. | තම ආයතනික අවශ්‍යතාව අනුව රක්ෂණ ආවරණයන් සලසා ගැනීමේදී චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2002 වර්ෂයේදී මිල දී ගෙන 2015 වර්ෂයේ සිට ධාවනයෙන් තොරව පැවති ත්‍රීරෝද රථය අලුත්වැඩියා කිරීමට, අපහරණය කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට මෙම වාර්තාවේ දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | මෙම ත්‍රීරෝද රථය මරදාන ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයට පැවරීමට කටයුතු කෙරේ | නිශ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතු විම. |

## 3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරින් වන අධ්‍යක්ෂ, ගණකාධිකාරි, රියදුරු ඇතුළු නිලධාරින්ගෙන් ඇප අය කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල නිලධාරීන්ගෙන් ඇප අය කළ යුතු වීම. |

## 4. යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික පනතේ 41 වන වගන්තියේ විධිවිධාන පරිදි සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටු තිබිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | 2023 පළමු කාර්තුව සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2023 මාර්තු 28 දින පවත්වන ලදි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 5 ක් එකම සේවා ස්ථානයෙහි සේවා කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ දීම සඳහා ස්ථාන | අදාල ආකෘතිය පරිදි අවුරුදු 05 සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. | නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | මාරු ලබා දිය යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 සිට 9 දක්වා, වර්ෂ 10 සිට 30 දක්වා සහ වර්ෂ 31 සිට 40 දක්වා පිළිවෙලින් නිලධාරීන් 90 ක්, නිලධාරීන් 27 ක් සහ නිලධාරීන් දෙදෙනෙකු වශයෙන් නිලධාරීන් 119 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 184 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 158 ක් වුයෙන් තනතුරු 24 ක පුරප්පාඩු පැවතුණි. මෙසේ පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය අඩු වීම කෙරෙහි බලපෑමක් ඇති කිරීමට හේතු වී ඇති බව නිරීක්ෂණය කෙරේ. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට නොයෙක් වර ඉල්ලීම් ඉදිරිපත් කළද පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු විම. |